**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - 2016**

**-----------------------------------------------**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 56 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 මතය ව්‍යාචනය

--------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනිමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

--------------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල ගනුදෙනු හා සිද්ධින් වාර්තා කිරීමේදී උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතු වුවත් දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබෙන ආදායම්, මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08**

-----------------------------------------------

(i) ඉඩමක අයිතිය ලබා ගැනීම සඳහා කොමිෂන් සභාවට එරෙහිව පවරන ලද නඩුවක පැමිණිලිකරුවන්ට රු.148,715,363 ක් ගෙවීමට 2009 වර්ෂයේදී අභියාචනාධිකරණය තීන්දුවක් ලබා දී තිබුණි. එදින සිට අදාල පොළියද සමඟ ගෙවිය යුතු මුදල රු. මිලියන 200 ද ඉක්මවා තිබුණද එය ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගෙන ඒ සඳහා හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ii) 58 වගන්තිය අනුව බැඳීමක් පියවීම පිණිස අවශ්‍ය අගයට බලපෑම් ඇතිවිය හැකි අනාගත සිදුවීම් ඒවා ඇති බවට ප්‍රමාණවත් අරමුණුගත සාක්ෂි පවතින විටෙක ප්‍රතිපාදන අගයෙහි පිළිබිඹු විය යුතුය. එසේ වුවද කොමිෂන් සභාවේ සේවකයින් සඳහා 2006 - 2013 කාලය දක්වා දීමනාවට අදාලව ගෙවිය යුතු රු. 32,763,795 ක සේවක අර්ථ සාධක අරමුදල් සහ ඒ සඳහා අධිභාර ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බදු කුලි ගෙවීමේ ප්‍රමාදය මත අයවිය යුතු අධිභාර රු. 1,417,607 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු බදු කුලී, ඛනිජ සම්පත් වලින් අයවිය යුතු ආදායම්, අයවිය යුතු පරිහරණ ගාස්තු හා අයවිය යුතු ප්‍රවේණි ගාස්තු පිළිවෙලින් රු.63,403,562, රු.205,143,151, රු.26,661,071 හා රු.1,079,043 ක් ලෙස එකතුව රු.296,286,827 ක් ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතු කොටගෙන එම ප්‍රමාණයෙන් ආදායම් සහ වත්කම් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී ජ'නල් සටහනක් මගින් සිදු කරන ලද වැරදි නිවැරදි කිරීමක් 2016 වර්ෂයේදී නැවතත් ගැලපීම හේතුවෙන් පරිගණක සහ උපාංග ක්ෂය වෙන්කිරීමේ ගිණුම රු. 786,034 ක් අඩුවෙන්ද පෙර වර්ෂ ගැලපුම් ගිණුම වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඈ) බදු ඉඩම් සම්බන්ධයෙන් කලින් ලද බදු කුලී වලින් 2016 වර්ෂයට අදාල රු.6,858,292 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත විය යුතු වුවත් සමුච්චිත අතිරික්තයට ගලපා තිබුණි.

(ඉ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ගෙවීමට සිදු වූ රු. 1,923,334 ක අධිභාරයෙන් රු.962,194 ක මුදලක් විශ්‍රාම පාරිතෝෂික වියදම් යටතේද ඉතිරි රු.961,140 ක මුදල සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ වියදම් යටතේද ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව අධිභාරය ලෙස ගෙවූ මුදල අධිභාරයක් ලෙස ගිණුම්ගත වී නොතිබුණි.

(ඊ) මූලා‍ය ප්‍රකාශනවල ඉඩම් ලෙස දක්වන රු.676,169,345 ක වටිනාකම, 1978 වර්ෂයේ මුල් වරට ගණනය කරනු ලැබූ ඉඩම් වටිනාකමට 2003 සහ 2006 වසරේදී කරනු ලැබූ සුළු ගැලපුමක් හැරුණු කොට 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම වෙනසක් නොවී එකම වටිනාකමක් ලෙස දක්වා තිබුණි. මේ අනුව වර්ෂයක් පාසා සිදු කෙරෙන අත්පත් කර ගැනීම්, විකුණුම් ආදිය ගැලපීමෙන් නිවැරදි වටිනාකම නිරූපනය කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූලා‍ය ප්‍රකාශන අනුව වන්දි අවිනිශ්චිත 1 සහ 2 අදියර යටතේ සමස්ත වගකීම රු.222,444,438 ක් වුවද තක්සේරු හා වන්දි අංශයේ වාර්තා අනුව ප්‍රකාශකයින් වෙත ගෙවීමට තිබූ වන්දි මුදල පොලී මුදල සහිතව රු.585,800,000 ක් විය. ඒ අනුව රු.363,355,562 ක වෙනසක් නිරීක්ෂණය වුයෙන් මෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආදායම් අංශයේ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු බදු කුලී ආදායම රු. 185,995,884 ක් වුවද, මූලා‍ය ප්‍රකාශනවල එය රු. 152,725,231 ක් ලෙස දැක්වීමෙන් බදු කුලී ආදායමේ රු. 33,270,653 ක වෙනසක් විය.

(ඇ) මූලා‍ය ප්‍රකාශනවල ඇතුළත් අත්තිකාරම්, අත්තිකාරම් ලේඛනය සමඟ සැසඳීමේදී රු. 84,297 ක වෙනසක්ද, බදු කුලී අත්තිකාරම්, උපලේඛනය සමඟ සැසඳීමේදී රු. 640,000 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගනුදෙනු සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් | 676,169,345 | ඉඩම් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන/ උපලේඛන |
| ලිපි ද්‍රව්‍ය තොග | 3,182,913 | විස්තරාත්මක උප ලේඛන |
| වන්දි අවිනිශ්චිත ගිණුම් | 222,444,438 | |

## 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1999 වර්ෂයේ සිට විවිධ ණයගැතියන්ගෙන් අයවිය යුතු රු. 2,311,017 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදිද එසේම පැවතුණු අතර එම වටිනාකම තහවුරු කිරීමට අදාල මූලාශ්‍ර ලියවිලි සභාව සතුව නොතිබුණි.

(ආ) වර්ෂ 1 ½ සිට වර්ෂ 07 කට අධික කාල පරාසයක් තුළ සේවය හැරගිය / වැඩ තහනම් කළ සේවකයින් 48 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල රු.745,785 ක් විය.

(ඇ) වසර 5 සිට වසර 10 කට අධික කාල පරාසයක් තුළ වූ ඉඩම් විකුණුම් අත්තිකාරම් රු.11,302,992 ක්ද, වසර 11 කට අධික කාලයක සිට ගෙවිය යුතුව පවතින රු. 11,230,850 ක බදු කුලී අත්තිකාරම්ද නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ඈ) ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් වලින් රු. 181,500 ක් වසර 7 සිට වසර 11 කට වැඩි කාලයක සිට පැවත එන බැව් දක්නට ලැබුණි. තවද, වෙළඳ හා අනෙකුත් ගෙවීම් යටතේ විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ගෙවිය යුතු ලෙස දැක්වෙන රු. 800,130 ක වටිනාකමක් වසර 11 කට අධික කාලයක් තිස්සේ පැවතුනු අතර ඒවා පියවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වන්දි අවිනිශ්චිත අදියර II ගිණුමෙන් 2005 වර්ෂයේ සිට වසර 12 ක් පුරා වන්දි නිරවුල් කිරීමක් සිදු වී නොතිබුණු අතර එම අවල ශේෂය රු. 109,959,493 ක් විය.

(ඊ) රාජ්‍ය ආයතන හා සංස්ථා මණ්ඩල වෙතින් දීර්ඝ කාලයක සිට බදු මුදල් අයවී නොතිබුණු අතර විගණනයට වාර්තා වී ඇති ආයතන දෙකකින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු බදු මුදල රු. 10,258,731 ක් විය. එසේම අනෙකුත් රාජ්‍ය ආයතන විසින් අයවිය යුතු බදු මුදල් පිළිබඳව විගණනයට වාර්තා කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත. | කොමිෂන් සභාව එකතු කළ අගය මත බදු පනත යටතේ ලියාපදිංචි වී නොතිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය. | රාජ්‍ය ව්‍යවසායයන්, අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද එසේ අනුමැතිය ලබානොගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රු.1,369,328,834 ක් ආයෝජනය කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 757 | වත්කම් අයිතම 6 කට අදාලව එකතුව රු.115,505,336 කට අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2011 අගෝස්තු 25 දිනැති අංක 11/ විවිධ (015-1) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | රාජ්‍ය සංස්ථා සහ රාජ්‍ය ආයතන විසින් ඉඩම් බැහැර කිරීමේදී අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද, කලුගල් සඳහා ඉඩම් බදු දීමේ ක්‍රියාවලියේදී එසේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (ඉ) 2002 මැයි 23 දිනැති අංක 2002/11 දරන පාලන චක්‍රලේඛයේ 05 වගන්තිය. | ඉඩම් බදුදීමේදී කොමිෂන් සභා තීරණ ලබා ගැනීමෙන් අනතුරුව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කෙරෙන අතර අනුමැතිය ලබාගෙන මැනුම් නියෝග නිකුත් කළයුතු වුවද එයට පටහැනිව මැනුම් කටයුතු අවසන් කරගෙන වසර 05 ක මුදල්ද අයකිරීමෙන් අනතුරුව අමාත්‍යවරයාගේ අනුමැතියට යවා තිබුණි. |
| (ඊ) 2008 අප්‍රේල් 17 දිනැති අංක 2008/ පොදු/ 1 දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ 1(i) සහ (ii) වගන්තිය | අදාල වර්ෂය සඳහා භිහ පරිහරණ ගාස්තු එම වසර තුළදීම අයකර අවසන් කළ යුතු බවත් භිහ පරිහරණ ගාස්තු නොපමාව අයකළ යුතු බවත් දැක්වුවද වසර ගණනාවක පරිහරණ ගාස්තු අයකර නොතිබුණි. |

**2.5** ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
------------------------------------------------------------

අක්කර 5 ට වැඩි කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මොණරකැලේ වත්තෙන් අක්කර 280 ක් පෞද්ගලික සමාගමකට වර්ෂ 2011 දී තිස් අවුරුද්දකට බදු දී තිබුණි. සමාගමෙන් අය විය යුතු රු. 10,764,622 ක බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**
**--------------------**

**3.1. මූල්‍ය ප්‍රතිඵල**
**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.120,442,701 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.55,708,450 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.64,734,251 ක වර්ධනයක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී පසුගිය වර්ෂයේ ලැබිය යුතු බදු කුලී ආදායම මෙම වර්ෂයේදී ගිණුම්ගත කිරීමෙන් බදු කුලී ආදායම රු. 61,376,383 කින් වැඩිවීමද, වෙනත් මෙහෙයුම් ආදායම් එනම් ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම් රු.42,446,909 කින් වැඩිවීමද මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පැවති අතර 2012 වර්ෂයෙන් පසුව ක්‍රමයෙන් අතිරික්තය අඩු වී 2016 වර්ෂයේදී නැවතත් ප්‍රමාණවත් වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. පසුගිය වර්ෂ 4 ක කොමිෂන් සභාවේ දායකත්වය පිළිබඳ ඇගයීමේදී පෙර වර්ෂයන්ට සාපේක්ෂව පිළිවෙලින් 2013 වර්ෂයේ රු. 12,728,112 ක පිරිහීමක්ද, 2014 වර්ෂයේදී රු. 14,994,085 ක වර්ධනයක්ද, 2015 වර්ෂයේ රු. 14,829,018 ක පිරිහීමක්ද, 2016 වර්ෂයේදී රු. 95,018,964 ක වර්ධනයක්ද දක්නට ලැබුණි.

**3.2 කොමිෂන් සභාවට එරෙහිව හෝ කොමිෂන් සභාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

2016 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවට එරෙහිව හා කොමිෂන් සභාව විසින් පවරා ඇති නඩු සංඛ්‍යාව 562 ක් ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී කොමිෂන් සභාවට එරෙහිව පවරා ඇති නඩු සංඛ්‍යාව 68 ක් වූ අතර, කොමිෂන් සභාව විසින් පවරා තිබූ නඩු සංඛ්‍යාව 22 ක් ද වූ අතර, අධිකරණ තීන්දු ලබාදුන් නඩු සංඛ්‍යාව 35 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 2 වගන්තිය ප්‍රකාරව යම් තැනැත්තකුට අයිති උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම්, එම තැනැත්තන් අයිතිව තබා නොගැනීම, සුරක්ෂිත කිරීම, පවරා ගැනීම හා ඒ ඉඩම්වල නිෂ්පාදනය සහ ඒ ඉඩම් වලින් ඇතිවන රැකී රක්ෂා ප්‍රමාණය වැඩිවීමේ ප්‍රතිඵලය දෙන ක්‍රමයකට ඒවා ප්‍රයෝජනයට ගැනීම කොමිෂන් සභාවේ මූලික අරමුණ වේ. කොමිෂන් සභාවේ අරමුණු ඉටුකිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබාදීම**

(i) 1972-1974 අතර කාලසීමාවේදී ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබූ ඉඩම් වලට අදාලව මේ දක්වාත් එනම් වර්ෂ 40 ක් ඉක්මවාද ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබා නොදුන් පුද්ගල සංඛ්‍යාව 235 ක් විය. මින් සියයට 25 ක් පිඹුරු ඉදිරිපත් නොකිරීම මතද, සියයට 53 ක් ප්‍රකාශකයින් ඉදිරිපත් නොවීම මතද ව්‍යවස්ථාපිත නිශ්චයන් ලබාදීමට නොහැකි වී තිබුණි.

(ii) පිඹුරු ඉදිරිපත් කිරීම, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ මැදිහත්වීමෙන් අදාල ප්‍රකාශක ලවා ඉටුකරවා ගතයුතු වුවද වර්ෂ 40 කට අධික කාලයක් තුල පිඹුරු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) මෙසේ ව්‍යවස්ථාපිත නිශ්චයන් ප්‍රමාද වුවද ඉඩම්වල භුක්තිය ප්‍රකාශක වෙත තිබීම තුළ කොමිෂන් සභාවට පවරා ගන්නා ලද මෙම ඉඩම් ප්‍රයෝජනවත් ලෙස භාවිතා කිරීමට සහ ආදායම් උපයාගැනීමට පවතින ඉඩකඩද සීමාවී තිබුණි.

**(ආ) වන්දි ගෙවීම**

(i) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වන වගන්තිය යටතේ වන්දි ගෙවීමට අදාල ගැසට් නිවේදන පල කරන ලද හිමිකම් තහවුරු නොවූ ලිපිගොනු 104 ක් වර්ෂය ආරම්භයේදී පැවතුනු අතර ඉන් 2016 වර්ෂයේදී වන්දි ගෙවීමට හැකිව තිබුණේ 3 ක් සඳහා පමණි.

(ii) පනතේ 33 වගන්තිය ප්‍රකාරව හිමිකම් තහවුරු වී ඇති යම් තැනැත්තෙකුට ගෙවිය යුතු යම් වන්දියක් ඔහු විසින් පිලිනොගන්නා ලද අවස්ථාවක හෝ, තැනැත්තා මිය ගොස් ඇති විට හෝ, ඔහු ගැන දැනගැනීමට නොහැකි අවස්ථාවක ඒ වන්දිය එය හිමි තැනැත්තා විසින් ලබා ගැනීමට හැකි පරිදි සිවිල් අධිකරණ බලය ඇති අධිකරණයක තැන්පත් කළ යුතු වුවද ලිපිගොනු 127 කට අදාලව මුදල් අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ඉටුකිරීමේ ප්‍රගතිය**

(i) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ උපරිම සීමාව ඉක්මවා ගිය ඉඩම් හෙළිදරව් කරගැනීම, කොමිෂම වෙත පැවරී ඇති ඉඩම් ලියාපදිංචි කිරීම හා හිමිකම් හා ලේඛන ලියාපදිංචි කිරීම, ඉඩම් විෂයය පිලිබඳව විධායක නිලධාරින්ට සහ ක්ෂේත්‍ර නිලධාරින්ට පුහුණු වැඩසටහන් පැවැත්වීම, විශේෂිත තනතුරු සඳහා පරිගණක පුහුණුව ලබාදීම, විධිමත් කාර්යසාධන ක්‍රියාවලියක් ආරම්භ කිරීම, ලේඛන සංරක්ෂණය කිරීම සහ විධිමත් ලේඛනාගාරයක් ස්ථාපිත කිරීම, අනවශ්‍ය ලිපිගොනු අපහරනය කිරීම, ලේඛනාගාරයේ ඇති ලිපිගොනු පරිගණකගත කිරීම යනාදී ක්‍රියාකාරකම් කිසිසේත් ඉටුකර නොතිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව දක්වා තිබූ ක්‍රියාකාරකම් 16 ක ඉලක්කයන්ගෙන් සියයට 50 කට අඩු ප්‍රගතියක් අත්කරගෙන තිබුණි.

(iii) සමස්තයක් ලෙස ගත් විට ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන්ගෙන් සියයට 50 ක් හෝ ඊට අධිකයක් ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 35 ක් තරම් වූ පහළ මට්ටමක පැවතුණි.

## 4.2. කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටි ඇබර්ෆොයිල් වත්ත ඉඩමෙන් පර්චස් 20 ක් සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් සඳහා 2014 වර්ෂයේදී වසර 30 ක කාලයක් සඳහා බදු දීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද ඒ වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල සහ තක්සේරු හා සේවා ගාස්තුව වූ රු. 2,707,711 ක මුදල විගණන වාර්තාවේ දිනය දක්වාම ගෙවීම් සිදු කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති ඉඩම් බදුදීමට අදාල නිශ්චිත ක්‍රියාපරිපාටිය දැක්වෙන ලිඛිත මඟපෙන්වීමක් කොමිෂන් සභාව විසින් සකස් කර නොතිබුණි.

(ඇ) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව අක්කර 50 ට වැඩි ඉඩම් සභාව වෙත පවරා ගැනීමෙන් පසුව ව්‍යස්ථාපිත නිශ්චයන් ලබාදීමේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ කු/121 ප්‍රකාශකට අයත් අක්කර 89 පර්චස් 27 ක් සභාවට පවරාගෙන තිබුණි. එම පැවරුමට අදාල ව්‍යවස්ථාපිත නිශ්චය ලබාදීම වසර 40 කට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි.

(ඈ) කො/2962 දරන ප්‍රකාශකට අයත් අක්කර 175 පර්චස් 36.66 ක ප්‍රමාණයක් 1975 සහ 1981 වර්ෂ වලදී කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර තිබුණි. ඒ සඳහා වූ ව්‍යවස්ථාපිත නිශ්චයන් වශයෙන් හුවමාරු ඉඩම් රත්නපුර, කෑගල්ල සහ ගම්පහ දිස්ත්‍රික්ක වලින් අක්කර 50 ක් ද ලබා දීමට කැබිනට් ස්ථාවර කමිටුවේ අනුමැතිය ලබා ගෙන තිබුණද එයින් අක්කර 40 ක් පමණක් නිදහස් කර තිබුණි.

(ඉ) කුරුණෑගල වැව්ලි සමාගම මඟින් පාලනය කළ දනව්කන්ද වත්ත ඉඩමෙන් අක්කර 05 ක ප්‍රමාණයක් 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1)(ආ) වගන්තය යටතේ පුද්ගලයකුට බදු දී තිබූ අතර ඒ සඳහා කළුගල් කැඩීමට කුරුණෑගල වැව්ලි සමාගමේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි. තවද බදු ගනු ලැබූ පුද්ගලයා ඉදිරිපත් කර තිබූ තොරතුරු සාවද්‍ය විය.

(ඊ) කොමිෂන් සභාවේ පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම සඳහා රු. 6,591,676 ක් දරා තිබුණු අතර 2016 ජූලි 29 දින වැඩ නිම කර තිබුණි. එසේ වුවද විගණිත දිනය වූ 2017 මාර්තු 23 දින වන විටත් කාර්යාල කටයුතු ආරම්භ කර නොතිබුණි.

## 4.3. මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

තෝරවැටියවත්ත ඉඩමේ ව්‍යවස්ථාපිත නිශ්චය වශයෙන් අක්කර 50 ක ප්‍රමාණයක් ප්‍රකාශකට නැවත පවරා දී තිබුණ ද මායිම් නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් ප්‍රකාශක විසින් අමතර අක්කර 108 ක් ද භුක්ති විඳ තිබුණි. නීතියට පටහැනිව අමතර භුක්ති විඳින අක්කර 108 හි භුක්තිය ලබා ගැනීමට හෝ බදු දීමට හෝ කටයුතු නොකිරීමෙන් කොමිෂන් සභාවට අලාභයක් සිදු වී තිබුණි.

## 4.4. මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි අක්කර 593 ක් වූ මැද්දෙගෙදරවත්ත ඉඩමෙන් පුද්ගලයන් 6 දෙනෙකුට එකතුව අක්කර 319 ක් අමාත්‍ය මණ්ඩල තීරණයක් නොමැතිව 2016 වර්ෂයේදී බදු දී තිබූ අතර එහිදී රජයේ තක්සේරුවක් රහිතව දළ තක්සේරුව වූ රු. 4,546,000 ක මුදලකට බදු දී තිබුණි.

(ආ) පෙතියකන්ද වත්තෙන් අක්කර 100 ක ප්‍රමාණයක් 30 අවුරුදු බදු පදනමට 2004 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත භාරදී තිබුණු අතර එය 2004 අගෝස්තු 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් තහනම් කර තිබුණි. තවද මෙම පැවරීම සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණ අතර භාවිතයේ පවතින ඉඩම් පැවරීමේ ක්‍රමවේදයද අනුගමනය කිරීමෙන් තොරව රු. 100,000 ක බදු කුලී අත්තිකාරම් මුදලක් පමණක් ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් එවා ඇති සභාපතිවරයාගේ පිළිතුර අනුව 2017 මාර්තු 20 දින බදුකරු භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය ඔහුට නැවත පැවරීමට සභාපතිවරයා තීරණය කර තිබුණි.

(ඇ) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇත්හොඩගල නින්දගම නැමැති ඉඩමෙන් අක්කර 49 රූඩ් 03 පර්චස් 30 ක ප්‍රමාණය පෞද්ගලික සමාගමකට රු. 100,000 ක බදු අත්තිකාරමක් ලබා ගැනීමෙන් 2003 අගෝස්තු 22 දින දී භුක්තිය භාරදී තිබුණි. 2016 අගෝස්තු 21 වන දිනට හිඟ බදු මුදල හා සියයට 10 ක අධිභාරයද සමඟ රු. 2,527,224 ක් අයවිය යුතු වුවද සමාගම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම හිඟ බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ නිකපොත මුතුවානවත්ත නමැති ඉඩමෙන් අක්කර 98 ක ප්‍රමාණයක් පෞද්ගලික සමාගමක් වෙත 2004 වර්ෂයේදී වසර 30 කාලයක් සඳහා බදු දී තිබුණි. මෙම පැවරීම අවිධිමත් පැවරීමක් වන බැවින්, 2004 අගෝස්තු 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් එය අවලංගු කර තිබුණි. කෙසේ වුවද අමාත්‍ය මණ්ඩල තීරණය නොසලකා මෙම ඉඩම 30 අවුරුදු කාලයකට එම සමාගමට බදු පදනමට ලබාදීමට 2008 අගෝස්තු 26 දිනදී කොමිෂන් සභා තීරණයක් ගෙන තිබුණි. තවද, අක්කර 100 කට ආසන්න මෙම ඉඩමෙන් සභාවට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

(ආ) 1985 වර්ෂයේදී අම්බලමානවත්ත ඉඩමෙන් අක්කර 05 ක ප්‍රමාණයක් සිදු තිරුවානා ගල් ව්‍යාපෘතියක් සඳහා පුද්ගලික සමාගමක් වෙත විකිණීමෙන් පවරා දී තිබුණු අතර මෙම පැවරීමද 2004 අගෝස්තු 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අවලංගු කර තිබුණි. තවද 2002 වර්ෂයේ සිට මේ දක්වා සමාගම විසින් සිලිකා කැඩීම සිදු කරනු ලබන බැවින් ඒ සඳහා නීතිමය පියවර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. එසේම ඉන් කොමිෂන් සභාවට විශාල ආදායමක් ලබාගැනීම ද අහිමි වී තිබුණි.

(ඇ) ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පිලගොඩවැලි වතුයායෙන් අක්කර 660 ක ප්‍රමාණයක් 2004 පෙබරවාරි 27 දින කොම්පෝස්ට් පොහොර නිපදවීමේ ව්‍යාපෘතියක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත බදු දී තිබුණි. මෙම බදු දීම ද 2004 අගෝස්තු 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් තහනම් කර තිබුණි. එසේම එම සමාගම විසින් කොම්පෝස්ට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් බැහැරව වෙනත් කටයුත්තක් වෙනුවෙන් යොදවා තිබුණි. නැවත එම ඉඩම් පවරා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබූ අතර විගණිත දිනය දක්වා කිසිදු බදු මුදලක් අයකර නොතිබුණි.

(ඇ) ගම්පහ දිස්ත්‍රික්කයේ බටගොල්ල, රූනගල යන ඉඩම් වලින් අක්කර 48 ක් පුද්ගලික සමාගමක් වෙත 2004 වර්ෂයේදී බදු දීමේදී මූලික තක්සේරුව ලෙස රු. 224,000 ක බදු මුදලක් නියම කර තිබුණු අතර, වර්ෂ 5 න් 5 ට රජයේ තක්සේරුව ලබාගෙන බදු සංශෝධනය කිරීමට නියමිත වුවත්, 2016 දෙසැම්බර් 31 දින වන විට වසර 12 ක් ගත වී ඇති බැවින් බදු සංශෝධන 2 ක් තක්සේරු කළ යුතු වුවත් එසේ කර නොතිබුණු අතර සියයට 50 ක වටිනාකමක් එකතු කර තාවකාලික බදු සංශෝධනයක් සිදු කර බදු අය කර තිබුණි.

## 4.6. කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 45(1)(ආ) වගන්තියට පටහැනිව ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2015 පෙබරවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා පත් කර තිබුණි. තවද ඔහුගේ කාර්ය පැවරුම් යටතට කොමිෂන් සභාවේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා වාර්ෂික අයවැය හා වාර්ෂික වැඩ සටහනක් ප්‍රධාන කාර්ය සාධක දර්ශක සමඟ සකස් කළ යුතු වුවද එම කටයුතු ඉටු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------

## 5.1. අභ්‍යන්තර විගණනය

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කළ විගණන විමසුම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) අභ්‍යන්තර විගණන සැලැස්මේ දක්වා තිබූ අංශයන් ආවරනය කෙරෙන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණු අතර 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5)(ඩී) වගන්තිය ප්‍රකාර අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2. ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන ප්‍රකාරව රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.

## 5.3. අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ තථ්‍ය හා අයවැයගත ආදායම් හා වියදම් පරීක්ෂාවේදී ආදායම් විෂයයන් 02 කට අදාලව සියයට 39 සිට සියයට 53 දක්වා සහ වියදම් විෂයයන් 16 කට අදාලව සියයට 38 සිට සියයට 167 දක්වා වූ පරාසයක සැලකිය යුතු විචලනයන් අනාවරනය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5.4. විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක PED 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අඩු තරමින් වර්ෂයකට විගණන කමිටු රැස්වීම් 4 ක් වත් පැවැත්විය යුතු වුවද 2016 වර්ෂයේදී රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි.

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිගණක මෘදුකාංග පැකේජයක් මිලදී ගැනීම සඳහා 2002 වර්ෂයේ ගෙවා තිබුණු රු. 17,000,000 ක මුදලක් වසර 15 ක් තිස්සේ පරිගණක අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණු නමුත්, මෙම සටහන නිරවුල් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට විගණිත දිනය වූ 2017 මාර්තු 25 දින වන විටත් නොහැකි වී තිබුණි.

(ආ) වර්ෂ 11 කට අධික කාලයක සිට පැවතුණ රාජ්‍ය ආයතන 8 කින් අයවිය යුතු රු.2,135,625,366 ක මුදල සමාලෝචිත වර්ෂයේදීද එසේම පැවතුණු අතර, ඒ සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ග ගැනීමට මෙම වර්ෂයේදීද අසමත් වී තිබුණි. 2016 මාර්තු 23 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත සපයා තිබූ පිළිතුර ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්, සභාපති සහ භාණ්ඩාගාරයේ මැදිහත් වීම මත සියලුම පාර්ශවයන් කැඳවා තීරණයක් ලබා ගත යුතු බවට දක්වා තිබුණද මේ දක්වාත් තීරණයක් ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් වූ අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) හිඟ ආදායම් පිළිබඳ වාර්තා යාවත්කාලීන නොවීම. |
| | (ii) ආදායම් අංශය, ඉඩම් පැවරීම අංශය, ව්‍යාපෘතිය අංශය ඇතුළු අනෙකුත් සියළුම සම්බන්ධිත පාර්ශව ගිණුම් අංශය සමඟ සම්බන්ධීකරණයන් නොවීම. |

| | | |
|---|---|---|
| (ආ) | ණයගැති පාලනය | (i) ඇතැම් රාජ්‍ය ආයතන වෙතින් සභාවට අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් අදාල අංශ වෙතින් දැනුම් නොදීම හේතුවෙන් ගිණුම්ගත කිරීමට නොහැකි වීම. |
| | | (ii) අයවිය යුතු බදු මුදල් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබීම. |
| | | (iii) ණයගැති ශේෂ සනාතන ලබාගෙන නොතිබීම. |
| (ඇ) | ව්‍යාපෘති සඳහා ඉඩම් බදුදීම | (i) ව්‍යාපෘතීන් සඳහා ඉඩම් බදු දීමේදී බදු කරුවන් තෝරා ගැනීමේ ක්‍රමවේදයක් නොතිබීම. |
| | | (ii) කිසියම් ව්‍යාපෘතියක්, ව්‍යාපෘතියක් වන බවට අදාල කරගතයුතු නිශ්චිත නිර්නායක කවරේද යන්න සහ එම නිර්නායක ඇගයීමෙන් ව්‍යාපෘතියක් වනවාද නැත්ද යන්න සලකා බැලීමක් සිදුකිරීමක් සභාව විසින් මේ දක්වාත් සිදුකර නොතිබීම. |
| (ඈ) | ආදායම් එකතු කිරීම | (i) දිස්ත්‍රික් බල මණ්ඩල විසින් එක් එක් කාර්යාල වලින් එක් එක් වර්ග වලට අදාලව අයවිය යුතු විවිධ ආදායම් විස්තරාත්මකව ලේඛනගත නොකිරීම. |
| | | (ii) හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | ගබඩා පාලනය | (i) තොග ලේඛන යාවත්කලීනව නඩත්තු නොකිරීම. |
| | | (ii) වාර්ෂික තොග සමීක්ෂණය සිදුකර නොතිබීම. |
| | | (iii) ගබඩා පරීශ්‍රය ක්‍රමවත්ව නඩත්තු නොකිරීම. |